# අපූරු ගුරුතුමිය සහ අපූරු දියණියෝ



කතාව, පිටකවරය සහ චිත්‍ර
එස්. එම්. විශ්වනී සමරකෝන් බණ්ඩාර

# අපූරු ගුරුතුමිය

# සහ

# අපූරු දියණියෝ

එස්. එම්. විශ්වනී සමරකෝන් බණ්ඩාර

# අපූරු ගුරුතුමිය
# සහ
# අපූරු දියණියෝ

ප්‍රථම මුද්‍රණය : 2019 ඔක්තෝබර්

කර්තෘ :- එස්.එම්. විශ්වනී සමරකෝන් බණ්ඩාර,
මහමායා බාලිකා විදුහල,
මහනුවර.

අංක 29/07, ලුවී පීරිස් මාවත,
මහනුවර.

මුද්‍රණය :- නෙත්වින් ප්‍රින්ටර්ස්
''දළඳා සෙවනේ අපි පදනම''
ගැටඹේ හන්දිය, මහනුවර
081 2 386 908

# පිදුම

පූජ්‍ය මේධංකර අපේ හාමුදුරුවන්ටත්
මා මෙළොවට බිහි කළ මගේ අම්මාටත්
මා හැදූ මගේ අප්පච්චීටත්,
මාගේ ආදරණීය මල්ලීටත්,
මට ආදරය කරන මගේ අත්තම්මලාටත්,
සීයාටත්, අත්තාටත්,
මට 1 - 2 වසරේ ඉගැන්වූ
රේණුකා ගුරු මෑණියන්ටත්,
ළමා දිවියේ අපූරුව ආදරයෙන් කියා දුන්
සමන්මලී ගුරු මෑණියන්ටත්,
මහමායා ප්‍රාථමිකයේ ගුරු මව්පියවරුන්ටත්,
මාගේ 4 - B පන්තියේ
මගේ යෙහෙළියන්ටත් මේ පොත
පුදමි සෙනෙහසින්

# පෙරවදන

වත්තමන් අධ්‍යාපනයෙන් ඵලදායී පුරවැසියෙකු සතුටින් ජීවත් වන පවුලක් මෙන්ම ප්‍රඥාසම්පන්න දැනුමෙන් යුත් බහුවිධ කුසලතාවන්ගෙන් සපිරි පුරවැසියන් සහිත සමාජයක් ගොඩ නැගීම අපේක්ෂාවයි. එසේ නම් පාසලට වගකීම් පවරන දරුවාගේ විභවතා හඳුනාගෙන ඒවා ඔපවත් කිරීම තුළින් ගෝලීය සමාජයට ගැළපෙන ලෙස හැඩගැස්වීම අපගේ වගකීමයි එම ජාතික අරමුණු මෙන්ම පාසලේ දර්ශනයට අනුව යමින් අපගේ මගපෙන්වීම යටතේ ලේඛනකරණය සහජයෙන් උරුමකරගත් මහාමායා දියණියන් වසර ගණනාවක් සිට විවිධ අරමුණු පෙරදැරිකොට ගෙන ග්‍රන්ථකරණයට යොමු කිරීමේ ප්‍රතිඵලයක් ලෙස දේශීය සාහිත්‍යය කෙතේ ලේඛක අංකුර දහස් ගණනක් වැපිරීමට ලැබීම පාසලක් වශයෙන් ලැබූ සුවිශේෂ ජයග්‍රහණයක් මෙන්ම කාලීන ජාතික අවශ්‍යතාවයක් සපුරාලීමකි.

එහි ඉදිරි දිගුවක් ලෙස පාසල තුළ ගොඩනැගී ඇති පොත් ලිවීමේ සංස්කෘතිය මෙවර ඩිජිටල් තාක්ෂණික යුගයේ ස්මාර්ට් දරුවනට ගැළපෙන ලෙස නවීකරණය කරමින් ''දිවිය දිනන විද්‍යුත් පොතක්'' ව්‍යාපෘතිය හඳුන්වාදෙන ලදී. දරුවන්ට අත්දැකීම් සමුදායක් මෙන්ම ගත්කතුවරයෙකු වීම හරහා ජීවිතයට එකතුවන වටිනාකම සළකා අධ්‍යාපන අමාත්‍යංශ අනුමැතියෙන් රටේ ම පාසල් දරුවන් අතර විද්‍යුත් පොතක් ලියන්නට සිහින දකින දරුවන් සහෝදරත්වයෙන් අප හා එක්වීම අගය කරමි.

2023 සාහිත්‍ය මාසයට සමගාමී ව අප පාසල විසින් සංවිධානය කළ ''දිවිය දිනන විද්‍යුත් පොතක්'' ව්‍යාපෘතියට එක් වූ පුංචි ලේඛක ලේඛිකාවන්ට මෙම කෘතිය තුළින් ලැබුනු අත්දැකීම් ඉදිරි අධ්‍යාපනයට මෙන්ම අනාගත දිවියට ශක්තියක් වේවා'යි ප්‍රාර්ථනා කරමු.

මෙම ව්‍යාපෘතිය වෙනුවෙන් සහාය දැක්වූ අප පාසලේ කළමනාකරණ මණ්ඩලය ගුරු භවතුන් දෙමාපියන් ආදී ශිෂ්‍යාවන් සෙසු පාසල් වල දරුවන් යොමු කළ විදුහල්පතිවරුන් ගුරු භවතුන් මෙන්ම නන් අයුරින් උදව් උපකාර කළ සැමට හෘදයාංගම ස්තූතිය මෙමඟින් පිරිනමමි.

ශශිකලා සේනාධීර
විදුහල්පතිනිය,
මහාමායා බාලිකා විද්‍යාලය, මහනුවර

# කර්තෘගෙන්

මම මේ පොත ලිව්වේ හතර වසරේ මාගේ ආදරණීය සමන්මලි ගුරුතුමිය නිසා ඈ තමා මට කියා දුන්නේ එකමුතු වී වැඩ කිරීමෙන් ජීවිතයට හරිම සතුටු දේවල් දෙන්න පුළුවන් කියලා

එදා අපි පන්තියක් හැටියට පාසල තුළ  කැපී පෙනෙන පන්තියක් වුණා ඒ දේ වුනේ අපි එකමුතුවී වැඩ කරපු නිසා ඉතින් අදටත් අපි අපේ පන්තියේ ළමයි හරිම එකමුතුයි ඉතින් එකමුතු වී සමගියෙන් වැඩ කිරීම මගින් අපට දුර ගමනක් යන්න පුළුවන්

විශ්වනි



මම 2 වසරේ සිට 3 වසරට යන දවස. 2 වසරේ ගුරුතුමියගෙන් වෙන් වෙලා මම දුකින් හිටියේ. උදේම නැගිටලා මූණ සේදුවා. ඇඳුම් ඇඳගත්තා. කෑම කාලා පාසල් යන්න සූදානම් වුණා. අප්පච්චි එක්ක පාසල් ගියා. මම පන්තියේ පළමු පේළියේ ඉඳගත්තා. අලුත් ගුරුතුමියක්. මට හරිම සතුටුයි. ඇය හරිම ලස්සනයි. එදා ඇය අපට ලස්සන කතාන්දරයක් කියලා දුන්නා. එකමුතු වෙලා වැඩ කරලා ජය ලැබූ පුංචි ළමයි පිරිසක් ගැන තමයි කතාව. "අපිත් ඒ වගේ එකමුතු වෙලා වැඩ කරනවා." අපි හිතුවා.



එදා ඉඳලා අපි හැමෝ ම ආසාවෙන් පාසල් ආවේ. කවි, කතන්දර, සිංදු , ගණන් පාඩම් අතරේ ඈ අපට හොඳ පුරුදු කියා දුන්නා.

ගණන් හැදුවා, අකුරු ලිව්වා, චිත්‍ර ඇන්ඳා, හුඟක් වැඩ කළා. ආසාවෙන් වැඩ කරන නිසා මහන්සියක් නම් දැනුණෙ නෑ. අපේ පන්තියේ හැමෝ ම හොඳ යාළුවො වුණා. එකමුතු වෙලා විවිධ ප්‍රසංගයෙ දී අපේ ම කටහඬින් අපි ගයපු ගීතය එක්ක ඉදිරිපත් කළ නැටුමට හැමෝ ම ප්‍රශංසා කළා. විභාගෙ දි අපි හැමෝ ම වගේ හොඳට ලකුණු ගත්තා. අපිට හරි ම සතුටුයි.



කාලය වේගයෙන් ගෙවී ගියා. අවුරුද්ද අවසානය ළං වුණා. මට ගොඩක් දුකයි. "ආයේ අපට මැඩම් නැහැ."කියලා මම හිතුවා. අවුරුද්ද අවසන් වුණා. හරි අපූරු දෙයක් වුණේ. ඒ මොකද්ද දන්නවා ද? 4 පන්තියේදිත් මැඩම් ඉන්නවා ලු යාළුවෝ මට කිව්වා. මට හරිම සතුටුයි.

අලුත් පාසල් වාරය පටන් ගත්තා. 4 - B අපට ලැබුණේ දූවිලි පිරුණු අපිරිසිදු පන්ති කාමරයක්. අපට හරිම දුකයි.

"අපි එකතු වෙලා මේ පන්තිය ලස්සන කරමු" ගුරුතුමී කිව්වා. අපි හැමෝ ම එකතු වුණා. සතියක් යද්දී ලස්සන පන්ති කාමරයක් දකින්නට ලැබුණා.

"ඉස්කෝලේ ලස්සනම පන්ති කාමරය ඔයාලගේ " ලොකු අක්කලා කිව්වා. මට හරි සතුටුයි. එදා ඉදන් අපි හරි අපූරු වැඩ ගොඩක් කළා. කියන්න ද යාළුවනේ.



හැමදා ම උදේ ට ගුරුතුමිය අපිත් එක්ක අලුත් අත්දැකීමක් ගැන කතා කළා. හැමදාම පාඩම් පටන් ගන්න කළින් හොඳ පුරුදු ගැන කියලා දුන්නා.  ගුරුතුමීගේ පුංචි කාලේ ගැන අහන්න තමයි අපි හරි ම කැමති. අපිත් අපි ගැන රස රස කතා ගුරුතුමිය එක්ක කිවුවා. අපිට හොඳින් ඇහුම් කන් දෙන්නයි ලස්සනට කතා කරන්නයි පුරුදු වුණේ ඒ හින්දයි.

අපි හිටියේ යාළුවෝ වගේ. අසරණයන්ට සලකන්න, දෙමව්පියන්ට ආදරේ කරන්න, ඈ කවියෙන් ගීයෙන් කතාවලින් කියද්දි හරි ම ආසා හිතුණා. ඈය අපට හුඟක් ආදරය කළා. සමහර දවසට මට ඈට " අම්මා" කියවෙන්නේ ඒකයි.



4 – B පන්තියේ මගේ යාළුවෝ දන්සල් දුන්නා. කණ්ඩායම් බෙදිලා කොස්, දෙල්, සීනි සම්බෝල පාන්, අයිස්ක්‍රීම්, කඩල, බෙලි මල් දන්සල් දුන්නා. අපි හැමෝ ම සතුටු වුණා. ඕනෑ ම වැඩක් පිළිවෙලට කළොත් සාර්ථක වෙනවා කියලා එදා අපි ඉගෙන ගත්තා.

4 – B පන්තියේ අපේ යාළුවෝ හත් දෙනෙක් සමස්ත ලංකා තරගවලින් දිනලා එන දවසේ අපේ ගුරුතුමිය එක්ක එකතු වෙලා හදපු අපේ ම තූර්ය වාදක කණ්ඩායමකින් එයාලාව පිළිඅරගත්තා. පන්තියට පෙරහැරකින් එක්කගෙන ආවා. දිනපු යාළුවන්ට පුංචි උත්සවයක් තියලා පුදුම කළා. එයාලට හරි ම සතුටුයි. හැමෝගෙ ම හොඳ දේ අගය කරන්න අපි පුරුදු වුණා.



දවසක් අපේ යාළුවෙක්ගේ අප්පච්චි හුඟක් අසනීප වුණා. ඒ යාළුවා පන්තියේ දී දුක්වෙවී හුඟක් ඇඬුවා. ඒ අප්පච්චිට සනීප වෙන්න කියලා අපි හැමෝ ම පහන තියලා පිරිත් කිව්වා. පුදුමයකට වගේ අප්පච්චි සනීප වුණා. එදා ඉදන් කාට හරි කරදරයක් වුණාම අපි පහන තියලා පිරිත් කියනවා. ගිලන් රථයක ශබ්දය ඇහෙනකොට අපි නැගිටලා ඒ රෝගියාට සනීප වෙන්න ප්‍රාර්ථනා කරනවා. මේ පින් වැඩේට අපට ප්‍රශංසා එද්දි අපිට දැණුනා පුංචි අපේ සිතුවිලි හරිම බලවත් කියලා.

විභාගයට සතියකට කලින් විෂයන් වලට දක්ෂ යාළුවෝ එකතු කරගෙන " වර්ක් ෂොප් " වගේ පාඩම් කියලා දෙන්න ගුරුතුමිය පුරුදු කළා. අපි දක්ෂතා බෙදා ගත්තා. යාළුවෝ පාඩම් කියලා දෙද්දි ගුරුතුමිය ආසාවෙන් බලං හිටියා. හැම විෂයට ම වැඩි ලකුණු අරන්, ලොකු මැඩම්ගෙන් ප්‍රශංසනීය වාර්තා ගන්න 4 – B යාළුවෝ ගොඩකට පුළුවන් වුණා. හැමෝට ම හරිම සතුටුයි.

පාසල ඉදිරිපිට තාප්පේ මල් පෝච්චි එල්ලලා අලංකාර කළේ පුංචි අපේ පරිසරය ව්‍යාපෘතියෙන්. එය අපට ආදරේ කරන විදුහල්පති තුමියට, ගුරු මෑණීවරුන්ට, ගුරු පියවරුන්ට සහ සොඳුරු මහාමායාවට පුංචි අපි දුන්න ගුරු දිනේ තෑග්ග .................



"ඉතා හොඳයි මගේ දූ" ලස්සනට වැඩ කළා ම ගුරුතුමිය අපේ පොත්වල ලියනවා ට අපි හරිම කැමතියි.

"ඔය වගේ හොඳ මහමායා දරුවෝ වෙලා ලොකු වුණා ම ඔයාලගේ හොඳ ගති ගුණ වලින් මේ නුවර හුඟක් ලස්සන වේවි මගේ දූලා" ගුරුතුමිය හැමදාම කියන කතාව අපි මතක තියාගෙන ඉන්නේ.

අපි ලස්සන පන්ති පුස්තකාලයක් හැදුවා. යාළුවෝ ගොඩක් පොත් ගෙනත් තිබුණා. හුඟක් පොත් කියවපු නිසා දෙවන වාරයේ පුස්තකාලයාධිපතිනිය වුණේ මම. මේ පොත ලියන්නත් මම උනන්දු වුණේ ඒ හින්දා. යාළුවෝ හැමෝ ම හරි සතුටින් පොත් කියෙව්වා.

අපි හැමදා ම පාසල් ආවේ හුඟක් ආසාවෙන්. පාසලේ හැම ගුරුතුමියක් ම අපව අගය කරන කොට අපිට හුඟාක් සතුටු හිතුණා.



කණ්ඩායම්වල යාළුවෙක් ගෙනෙන කෙසෙල් කොළේ ලොකුම ලොකු බත් පාර්සල් හැමෝ ම එකතු වෙලා බෙදාගෙන කන්න ඈ අපට පුරුදු කළා. හැමෝ ම සමඟි වෙන්නත් ඒක හේතුවක් වුණා. ගුරුතුමියගේ බත් එකත් අනලා රස කරලා අපට කවපු දවස් තිබුණා. ඒ කෑමවල රස හැමදාම අපට මතක තියේ වී.

දඟම දඟ යාළුවෝ හොඳ ම හොඳ දක්ෂ යාළුවෝ කරන්න, හැමෝට ම හොඳ ගතිගුණ පුරුදු කරන්න, අපිව හොඳ නායිකාවෝ කරන්න, උනන්දුවෙන්, ඉවසීමෙන් වැඩ කරලා කණ්ඩායම් වැඩ හොඳට කරන්න අපි ගුරුතුමියට උදව් කළා.

ඔන්න ඔය වගේ අපූරු වැඩ ගොඩක් එක්ක අපේ අවුරුදු දෙක හුඟක් සතුටින්, විනෝදයෙන් ගෙවී ගියා. අපට මේ සතුටු පාසල් කාලේ හැමදාම මතක තියෙනවා. මේ කතාවේ අපට ආදරෙන් ජීවිතය කියලා දීපු අපූරු ගුරුතුමිය තමයි අපේ ආදරණීය සමන්මලී ගුරුතුමිය.

( පුංචි මහමායාවේ 4 – B පන්තියේ අපූරු දරුවෝ වෙනුවෙන් ලිව්වේ විශ්වනී බණ්ඩාර දූ)



# ස්තූතිය

දන්නව ද යාළුව නේ

හොඳ අය ඇසුරු කරන්න ලැබුණොත්

හොඳ වැඩ ම කළොත්

අපට හැමදාම සතුටින් ඉන්න පුළුවන්

තේරුණා නේ ද?

ස්තූතියි.

නිමි.

# පසුවදන

නූතන තාක්ෂණික මෙවලම් භාවිතයට එකතුවීමත් සමඟ සිදුවන සමාජ, ආර්ථික පරිවර්තනයන් හේතුකොටගෙන පොත පතින් දුරස්වන පාසල් දරුවන් නැවත පොත පතට සමීප කරවීම හරහා අධ්‍යාපනයේ ගුණාත්මක වර්ධනයක් ඇති කිරීම ඔවුන්ගේ සාහිත්‍යය නිර්මාණ හැකියාවන් ඔප්නැංවීම තුළින් රටේ සාහිත්‍ය ප්‍රබෝධයක් ඇති කිරීම වැනි බහුවිධ පරමාර්ථ ඇතිව 2014 වසරේ දී මා විසින් අධ්‍යාපන අමාත්‍යාංශය පෞද්ගලික යෝජනාවක් ලෙස පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමු කරන ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය හඳුන්වා දෙන ලදී. ඒ යටතේ වැඩි ම ග්‍රන්ථ ප්‍රමාණයක් රචනා කරමින් වාර්තාවක් තබන්නේ මහාමායා පුංචි ගත්කතුවරියන් ය.

පාසල තුල ගොඩනැගී ඇති ලේඛණ සංස්කෘතිය නව මාවතකට යොමු කරමින් රටේ සෙසු පාසල් දරුවන් හා එක්ව මෙවර ජාත්‍යන්තර පාඨකයන් වෙත ලඟාවීමට නූතන තාක්ෂණය හා බැඳුණු විද්‍යුත් කෘති රචනා කරන්නට විය. ඒ තුළින් සම්පාදනය වූ මෙම විද්‍යුත් කෘතිය දරුවන්ට අත්දැකීම් සමුදායක් ලබා දෙමින් අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුවට ඉවහල් වන අතර ම ඔවුන්ගේ හැඟීම් දැනීම් නිර්මාණාත්මක හැකියාවන් ශාස්ත්‍රීය හික්මීම ප්‍රදර්ශනය කරන කැඩපතකි. මෙම නිර්මාණ රටේ අධ්‍යාපනයේ දිශානතිය මෙන්ම සමාජ ප්‍රගමනයට මගපෙන්වන නිසා ප්‍රතිපත්ති සම්පාදකයින් සහ සැළසුම්කරුවන්ට මෙන්ම සමාජයේ වගකිවයුතු පාර්ශවයන්ට ආලෝකයක් සපයයි. පාසල් මට්ටමින් ආරම්භ කර ජාතික තලය දක්වා විවිධ අභියෝග මැද පැමිණි මෙම ව්‍යාපෘතියේ ජීවය වූයේ මහාමායා දියණියන් සහ පාසල් ප්‍රජාව බව ගෞරවයෙන් සිහිපත් කරමි.

දිවිය දිනන විද්‍යුත් පොතක් ව්‍යාපෘතියට මහාමායා දියණියන් සමඟ එක්ව විද්‍යුත් කෘතියක් රචනා කර ජනගතකරන්නට ඩිජිටල් වේදිකාවට පිවිසි ගත්කතු අංකුර ඔබට ලෝකය දිනන ගත්කතුවරයෙකු වීමට ශක්තිය ලැබේවා'යි පතමු...

මෙයට,
සෙනෙවිරත්න මහලේකම්
පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමු කළ ව්‍යාපෘතියේ නිර්මාපක



**එස්. එම්. විශ්වනී සමරකෝන් බණ්ඩාර,**
**මහමායා බාලිකා විදුහල,**
**මහනුවර.**